# පාලි ත්‍රිපිටක සාහිත්‍යයෙහි හමුවන 'වෙසී' හා 'ගණිකා' යන පදද්වය පිළිබඳ විමර්ශනයක්

බෝදාගම සුමනජෝති හිමි[1]

## හැඳින්වීම

ගණිකා වෘත්තිය වනාහි බුද්ධකාලයටත් ඒහා දීඝ අතීතයක් හා සම්බන්ධ වන්නකි. එහි ආරම්භය කවර යුගයකදී සිදුවූවක් ද යන්න පිළිබඳ නිසැක ව ම සඳහන් කිරීම අපහසු වූවකි. එහෙත් පෙරපර දෙදිග සාහිත්‍යයාගත ව හා ජනශ්‍රැතියාගත ව ගණිකාවන් සම්බන්ධ කථාපුවත් අන්තර්ගත ව තිබේ. පෙළදහම විමසීමේදී සිය ජීවන වෘත්තිය ලෙසින් මුදලට මිනිසුන්හට ලිංගික සේවය සැපයූ ස්ත්‍රීන් ''ගණිකා, වෙසී, නගරසොභිනී, රූපූපජීවනී'' යනාදි නම් රාශියකින් හඳුන්වා ඇත. එහිදී බහුල වශයෙන් දක්නට ලැබෙනුයේ, ''ගණිකා හා වෙසී'' යන පදද්වය යි. ගණිකා යන පදයෙන් හඳුන්වන ලද ප්‍රකට කාන්තා චරිත කිහිපයක් ත්‍රිපිටක සාහිත්‍යයෙහි හමු වේ. ඒ අතුරෙන් ''අම්බපාලී, අඩ්ඪකාසී, සාලවතී, සිරිමා'' යන චරිත ප්‍රමුඛ වේ. ඒ අතුරෙන් ''අම්බපාලී හා අඩ්ඪකාසී'' යන දෙදෙන භික්ෂුණී ශාසනයෙහි පැවිදි ව සිව්සස් දහම අවබෝධ කළ උත්තමාවියෝ වූහ. සිරිමා ද සිය ජීවිතයෙහි පසුකාලයේදී බුදුන් සරණ ගිය උපාසිකාවක වූවාය. අෂ්ටවිධ උපසම්පදාවන් අතුරෙහිලා ගැනෙන ''දූතෙන උපසම්පදාව'' පිරිනමන ලද්දේ ද අඩ්ඪකාසී තෙරණිය ට ය. එහෙත් 'වෙසී' යන පදයෙන් හඳුන්වනු ලැබූ කාන්තාවන් නාමික ව ත්‍රිපිටක සාහිත්‍යය තුළින් හඳුනාගත නොහැකිය.

ත්‍රිපිටක සාහිත්‍යයෙහි දැක්වෙන තොරතුරුවලට අනුව එකල ගණිකා වෘත්තිය සමාජයෙහි පිළිගැනීමට ලක් ව පැවති වෘත්තියක් ලෙසින් හඳුනාගත හැකිය. ඔවුන්ට රිසි සේ සාමාජීය ජීවිතයක් ගත කිරීමට බාධාවන් පැවත නොමැති බව පෙනේ. සෑම රටක ම, සංස්කෘතියක ම පාහේ නිත්‍යානුකූල ව හෝ එසේ නොමැතිව වෛශ්‍යා වෘත්තිය සමාජගත ව පැවති බව පෙනේ. සිංහල භාෂාවේ පවා එබඳු කාන්තාවන් හැඳින්වීම සඳහා ''වෙසඟන, ගණිකාව, අභිසාරිකාව, වේසි, රූ මනමාලිය, වේශ්‍යා, නගර ශෝභනිය'' යනාදි යෙදුම් රාශියක් භාවිත වේ. වේශ්‍ය වෘත්තිය පිළිබඳ කරුණු දක්වන, වේශ්‍යාවක සතු විය යුතු ගුණාංගාදිය දක්වන ''කාම සූත්‍රය'' නම් කෘතියක් සංස්කෘත සාහිත්‍යයෙහි දක්නට ලැබේ. එසේ ම විවිධ ලිංගික ඉරියව් කැටයම් කළ ''කජුරාහෝ'' නමින් ප්‍රකට දේවාලයක් ද භාරතයෙහි දැකගත හැකිය. මහාවග්ගපාළියෙහි චීවරක්ඛන්ධකය ආරම්භයෙහි දැක්වෙන ආකාරයට රජගහනුවර වැසියන්ගේ අදහස වී තිබෙන්නේ, අම්බපාලිය විශාලා මහනුවර සෝභාමත් කරන බව යි. එනිසා රජගහ නුවරට ගණිකාවක් සම්මත කරගත යුතු බව යි. සාලවතියට ගණිකා වෘත්තිය සඳහා ප්‍රවේශ වීමට සිදුවනුයේ ද ඒ හේතුවෙනි. මේ ආකාරයට වේශ්‍යා වෘත්තිය සම්බන්ධ ව සිය ජීවිකාව

[1] ven.sumanajothi@gmail.com

පැවැත්වූ කාන්තාවන් පිළිබඳ තොරතුරු රාශියක් පාලි ත්‍රිපිටක සාහිත්‍යය මගින් අනාවරණය කරගත හැකිය.

**පර්යේෂණ ගැටලුව**

පාලි ත්‍රිපිටක සාහිත්‍යයේ වේශ්‍යා වෘත්තියෙහි නියැලුණු කාන්තාවන් පිළිබඳ සඳහන් කිරීමේදී ප්‍රධාන වශයෙන් ''ගණිකා හා වෙසී'' යන පදද්වය දක්නට ලැබේ. ගණිකා යන නාමයට මුලින් අම්බපාලි, අඩ්ඪකාසි බඳු නාමයක් භාවිත වුව ද, වෙසී යන නාමය එබඳු සංඥා නාමයන් සමග සම්බන්ධ ව නැත. සිය වෘත්තිය වශයෙන් මුදලට ලිංගික සේවයෙහි යෙදුණ ද ගණිකා හා වෙසී යන පදද්වයෙන් හැඳින්වෙනුයේ, එක ම කාන්තාවක් ද, එසේත් නොමැති නම් එක ම වෘත්තිය තුළ ආකාර දෙකකට කටයුතු කළ කාන්තාව දෙදෙනෙක් ද යන්න විමසා බැලීම මෙහිදී පර්යේෂණ ගැටලුව වශයෙන් ඉදිරිපත් වේ.

**පර්යේෂණ ක්‍රමවේදය**

ගණිකා හා වෙසී යනු පාලි ත්‍රිපිටක සාහිත්‍යය තුළ වෙසඟනන් හැඳින්වීම සඳහා භාවිත වූ පදද්වයකි. එනිසා ත්‍රිපිටක සාහිත්‍යය තුළ එම පද භාවිත ස්ථාන හා එම පදයන්ට අටුවාවන්හි සපයන ලද අර්ථ විවරණ ඇසුරු කරගනිමින් මූලාශ්‍රය අධ්‍යයනයක් මෙහිදී සිදුවේ.

**සාකච්ඡාවට ලක්වන කරුණු**

බුද්ධකාලීන සමාජය තුළ ගණිකා වෘත්තියට සමාජ පිළිගැනීමක් වූ බව හඳුනාගත හැකිය. බුදුසසුන තුළ ප්‍රමුඛ උපාසිකාවන් ලෙසින් කටයුතු කළ කාන්තාවන් පවා ගණිකා වෘත්තියෙහි නියැලී ඇත. බුදුන් වහන්සේ පවා එබඳු කාන්තාවන්ට වෙනසක් දක්වා නොමැති බව අම්බපාලි ගණිකාව සම්බන්ධයෙන් දැක්වෙන කථාපුවත තුළින් ප්‍රකට වේ. එසේ ම එම කාන්තාවන් එක් රැයකට සිය සේවාවන් සඳහා කහවණු පනහ, සියය, දහස ආදි වශයෙන් අය කළ බව පෙනේ. සිය මන්දිර තුළ බොහෝ සේවිකාවන් පිරිවරාගෙන කටයුතු කළ ඔවුන්ගේ ඇසුරට පැමිණ ඇත්තේ ද රජවරු, සිටුවරු, ඇමතිවරු ආදි ප්‍රභූවරුන් ය. සාමාන්‍ය ජීවිත ගතකළ මිනිසුන්ට එබඳු මුදලක් වියදම් කළ නොහැකි වූ බව පෙනේ. ජනපද කලණියන් වශයෙන් කටයුතු කළ ඔවුන්ගේ කාර්‍ය වී තිබෙන්නේ තමන් කරා පැමිණෙන්නවුන්ට අවශ්‍ය පහසුකම් සලසමින් ඔවුන් තෘප්තිමත් කරලීම ය. වාත්සායනගේ කාමසූත්‍රයෙහි දැක්වෙන ආකාරයට ද ''ගණිකා, රූපූපජීවා හා කුම්භදාසී'' යනුවෙන් වෙසඟනන් තුන්කොටසක් දැකිය හැකිය. එයින් පෙරට ම උසස් ම කොටස හඳුන්වා ඇත්තේ ගණිකා යනුවෙනි. ඔවුහු සූසැට කලාවෙහි දක්ෂ වෘත්තිය නිපුණ, ප්‍රියශීලි පැවතුම්වලින් හෙබි පිරිසක් වූහ. එනිසා මනා නිපුණත්වයකින් යුතු ව තමන් කරා පැමිණි ප්‍රභූන් විශාල මුදලක් අයකරමින් සතුටු කළ කාන්තාවන් ගණිකා නමින් හැඳින්වූ බව පෙනේ.

වෙසී නමින් හඳුන්වන ලද වෙසඟනන් සිය සේවය අපේක්ෂා කරන්නවුන් වෙත ගොස් ඔවුන් සතුටු කරමින් මුදල් ඉපයූ පිරිසක් බව පෙනේ. භද්දවග්ගිය කුමාරවරුන්ගේ කථාපුවත දැක්වෙන මහාවග්ගපාළියෙහි "අථ බො සා වෙසී තෙසු පමත්තෙසු පරිචාරෙන්තෙසු භණ්ඩං ආදාය පලායිත්ථ." යනුවෙන් දැක්වේ. එයින් පැවසෙනුයේ එම කුමාරවරුන් සතුටු කිරීමට පැමිණි වෙසඟන ඔවුන්ගේ සම්පත් පැහැර ගෙන ගිය බව යි. එසේ ම භික්ෂූන් විෂයයෙහි පස්වැනි සංඝාදිසේසය පැනවීමෙහිලා ද මුල් වී ඇත්තේ එක්තරා වෙසඟනක් රතිසුව විඳිනු රිසි වූ පිරිමින් පිරිසක් වෙත උදායි හිමියන් විසින් උද්‍යානයක් වෙත යොමුකිරීම හේතුවෙන් ඇතිවූ ගැටලුවකි. එසේ ම වෙසඟනන් සමග එක ම තොටක නග්නව ස්නානය කළ භික්ෂුණීන්ට මුහුණදීමට සිදු වූ කරුණක් හේතුවෙන් පනවා වදාළ ශික්ෂාවක් භික්ඛුණී විභඞ්ගයෙහි අන්තර්ගත වේ. එකී ස්ථානයන්හි වෙසඟනන් හඳුන්වා ඇත්තේ වෙසී යන පදයෙන් විනා ගණිකා යන පදයෙන් නොවේ. ඔවුහු සාමාන්‍ය මිනිසුන් අතරෙහි ජීවත් වූ කාන්තාවෝ වෙති.

**නිගමනය**

පාලි ත්‍රිපිටක සාහිත්‍ය තුළ වෙසඟනන් හැඳින්වීමට යෙදෙන ගණිකා යන පදයෙන් හඳුන්වා ඇත්තේ උසස් පිළිගැනීමක් සහිත මහත් මුදලකට තමන් කරා පැමිණෙන ප්‍රභූන් තෘප්තිමත් කළ කාන්තාවන් ය. සාමාන්‍ය ජන සමාජය අතරෙහි වාසය කරමින් සිය පහස ලබනු රිසි පිරිමින් කරා යමින් ලිංගික සේවය ලබාදුන් කාන්තාවන් හැඳින්වීමෙහි ලා ගණිකා යන පදය වෙනුවට භාවිත ව ඇත්තේ වෙසී යන පදය යි. ඒ අනුව උසස් සමාජය ඇසුරු කරමින් සම්භාවනා සහිත ව සිය වෘත්තියෙහි නියැළුණු කාන්තාවන් ගණිකා යන නාමයෙන් ද, සාමාන්‍ය සමාජයෙහි ජීවත් වෙමින් මිනිසුන් කරා යමින් සිය වෘත්තියෙහි නියැළුණු කාන්තාවන් වෙසී යන නමින් ද හඳුන්වා ඇති බව නිගමනය කළ හැකිය.

ප්‍රමුඛ පදඃ ගණිකා වෘත්තිය, ත්‍රිපිටක සාහිත්‍යය, වෙසී, ගණිකා, ලිංගික සේවය

**ආශ්‍රිත ග්‍රන්ථ**

*බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලාව.* (2013). බු.ජ.ත්‍රි.මු. බණ්ඩාරගමඃ ධර්මචක්‍ර ළමා පදනම.

*හේවාවිතාරණ අටුවා ග්‍රන්ථ.* කොළඹ 10ඃ හේවාවිතාරණ ග්‍රන්ථ භාරය.

සෙනරත් යාපා, මුනිදාස. (2012). *වාත්ස්‍යායනගේ කාම සූත්‍රය.* කොළඹ 10ඃ රත්න පොත් ප්‍රකාශකයෝ.

රත්නපාල, නන්දසේන. (2014). *ශ්‍රී ලංකාවේ ගණිකාවෝ.* කොළඹ 08ඃ සදීපා ප්‍රකාශන මන්දිරය.